# ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය

## ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ පසු පිටු සකස් විය යුතු ආකාරය පිළිබඳ නියමුවක්

# ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය

## ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ පසු පිටු සකස් විය යුතු ආකාරය පිළිබඳ නියමුවක්

NATIONAL LIBRARY OF SRI LANKA
N L S L

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත
කොළඹ 07

**ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය : ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ පසු පිටු සකස් විය යුතු ආකාරය පිළිබඳ නියමුවක්**

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 2024

| | |
|---|---|
| ප්‍රථම මුද්‍රණය | 2002 |
| දෙවැනි මුද්‍රණය | 2003 |
| තෙවැනි මුද්‍රණය | 2012 |
| සිව්වැනි මුද්‍රණය | 2024 |

ISBN 978-624-5747-15-3

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අනුමැතිය ලද**
**ප්‍රකාශනගත සූචිකරණ දත්ත**

ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය : ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ පසු පිටු සකස් විය යුතු ආකාරය පිළිබඳ නියමුවක්. - කොළඹ : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2024.
පිටු 72 ; සෙ.මි. 21.

ISBN 978-624-5747-15-3

i. 070.5 ඩිවි 23 ii. ග්‍රන්ථ නාමය
1. ප්‍රකාශකයෝ හා ප්‍රකාශනය
2. ප්‍රකාශකයෝ හා ප්‍රකාශනය - අත්පොත, නියමු ග්‍රන්ථ, ආදිය

| | |
|---|---|
| පරිගණක පිටු සැලසුම | : දිනුක මලින්ද හේරත් |
| ප්‍රකාශනය | : ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය අංක 14, නිදහස් මාවත, කොළඹ 07. |
| මුද්‍රණය | : ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්, 165, දේවානම්පියතිස්ස මාවත, කොළඹ 10. |
| Titile | : Grantha Sekesme Kramawedaya : Granthayaka Mul Pitu, Anthargathaya saha Pasu pitu sakas wiya yuthu Aakaraya Pilibada Niyamuwak. |
| Author & Publisher | : National Library & Documentation Services Board, Sri Lanka. |
| Page | : 72 |
| Printed by | : Fast Printary (pvt) Ltd, 165,Dewanampiyathissa Mw, Colombo 10. |

# සිවු වැනි මුද්‍රණයේ පෙරවදන

ශ්‍රී ලංකාවේ ප්‍රකාශන ක්ෂේත්‍රයේ සැලකිය යුතු විශාල වර්ධනයක් පසුගිය කාලය පුරා දැක ගත හැකි විය. මුද්‍රණ ක්ෂේත්‍රය තුළ ඇති වී තිබෙන නව ප්‍රවණතා යටතේ කුඩා පරිමාණ ප්‍රකාශකයන් රාශියක් ක්ෂේත්‍රයට පිවිසීම ද එයට හේතු වී ඇත. කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ නිෂ්පාදන හා ප්‍රකාශන ක්‍රියාවලියේ සිදුවන සංඛ්‍යාත්මක වර්ධනයට සාපේක්ෂ ව ග්‍රන්ථ නිෂ්පාදන සහ ප්‍රකාශන ක්‍රියාවලියේ ද විධිමත් ප්‍රමිති භාවිතයට යොමු වීම ඇතැම් ප්‍රකාශකයන් වෙතින් බොහෝ දුරට ගිලිහී ගොස් ඇත. බොහෝ අවස්ථාවල එය ප්‍රකාශන ආයතනවලට අනන්‍ය ආකාරයෙන් සිදුවන බව පෙනී යයි. එහෙත් කෘතිවල ඒකමතියක් දක්නට ලැබීම ප්‍රකාශන ක්ෂේත්‍රයේ වඩා උසස් තත්ත්වයක් කරා ගෙන යෑමට වැදගත් වනු ඇත. මේ අනුව යමින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් 80 දශකයේ සිට ග්‍රන්ථ නිෂ්පාදනයේ දී සහ ප්‍රකාශනයේ දී ප්‍රමිති හඳුන්වා දීම සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් ග්‍රන්ථනාම දසදහසක්, දොළොස් දහසක් අතර සංඛ්‍යාවක් වාර්ෂික ව ලියාපදිංචි වන බව ISBN ඉල්ලුම දෙස බැලූ විට පැහැදිලි වේ. කෘති ලෙස ඉන් පොත් වැඩි ප්‍රතිශතයක්වත් ජනගත වන බව විශ්වාස කළ හැකිය. එසේ වුව විශේෂයෙන් අගනුවර කේන්ද්‍රීය සීමාවෙන් බාහිර ව නිසි ප්‍රමිති භාවිතයක් සිදු නොවන බව නිරීක්ෂණය වේ. බොහෝ අවස්ථාවල ප්‍රධාන පෙළේ ප්‍රකාශන ආයතන රැසක ද ප්‍රමිති නොසලකා කටයුතු කරන බව පෙනෙන්නට තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ නිෂ්පාදනය සහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පවත්නා ප්‍රමිති විධිමත් කිරීමත්, ප්‍රකාශන ආයතන සහ කර්තෘවරුන් දැනුම්වත් කිරීමත් අත්‍යවශ්‍ය වී පවතී.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මේ සම්බන්ධයෙන් "ග්‍රන්ථ සැකැස්මේ ක්‍රමවේදය" නමින් අත්පොතක් ප්‍රථමයෙන් 2002 වසරේ දී නිකුත් කරන ලදි. ප්‍රකාශන ක්ෂේත්‍රයේ

දී ඉහළ පිළිගැනීමකට සහ ඉහළ ඉල්ලුමකට ලක් වූ එම කෘතිය නැවත ප්‍රකාශයට පත් කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය තීරණය කළේ එහෙයිනි.

මෙම කාර්යයේ දී මුල් මුද්‍රණයෙහි සංශෝධන කළ යුතු තැන් පෙන්වා දුන් මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතාට ගෞරවාන්විත ස්තුතිය හිමි වේ.

එමෙන් ම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සිදු කළ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ (පුස්තකාල ප්‍රවර්ධන, ප්‍රමිතිකරණ, ප්‍රකාශන) සේනානි බණ්ඩාර, ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශයේ අංශ ප්‍රධාන මලික් චමින්ද ධර්මවර්ධන, හිටපු ප්‍රකාශන නිලධාරී සජන්ති බෝපිටිය යන මහත්ම - මහත්මීන්ට හා ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශයේ සියලු නිලධාරීන්ටත් ස්තුතිය පිරිනමමි.

තව ද එසේ ම මෙහි ව්‍යාකරණ දෝෂ නිවැරදි කළ ශ්‍රීනාත් ගණේවත්ත මහතාටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ තනුජා රංගිකා මහත්මියට ද පරිගණක පිටුසැකසුම සහ කවර නිර්මාණය කළ ප්‍රකාශන නිලධාරී දිනුක මලින්ද හේරත් මහතාට ද මුද්‍රණ කටයුතු කළ ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය ඇතුළු සියලු දෙනාට ද ස්තුතිය පළ කරමි.

**ඩබ්ලිව්. සුනිල්**<br>
අධ්‍යක්ෂ ජනරාල්,<br>
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,<br>
අංක 14, නිදහස් මාවත,<br>
කොළඹ 7.<br>
2024.11.30

# තෙවැනි මුද්‍රණයේ පෙරවදන

පසුගිය වසර කිහිපය ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශන ක්ෂේත්‍රයේ විශාල පිබිදීමක් ඇති වූ කාල වකවානුවක් ලෙස හැඳින්විය හැකි ය. රජයේ ආයතන, පෞද්ගලික ආයතන පමණක් නොව කර්තෘවරුන් ම ප්‍රකාශකයන් ලෙස කලඑළි බැසීම මෙම යුගයේ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයකි. කෙසේ වෙතත්, ප්‍රකාශකයන්ගේ ප්‍රමාණාත්මක වර්ධනයට සාපේක්ෂ ව එහි ගුණාත්මක පක්ෂයෙහි වර්ධනය පහළ මට්ටමක පැවතීම අවධානයට ලක් කළ යුතු කරුණකි. ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීමේ දී අනුගමනය කළ යුතු ප්‍රමිති ක්‍රියාමාර්ග භාවිත නොකිරීම බොහෝ ප්‍රකාශනවල දක්නට ලැබේ. ග්‍රන්ථයක මුල් පිටු, අන්තර්ගතය සහ පසු පිටු සකස් විය යුතු සම්මත ආකාරය ඇතුළු සමස්ත සැකැස්ම පිළිබඳ ව සමහර ප්‍රකාශකයන් සතු අවබෝධය ප්‍රමාණවත් මට්ටමක නො පැවතීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත. විශේෂයෙන් කර්තෘ ප්‍රකාශනවල මෙම දුර්වලතා බහුල ව දැකිය හැකිය.

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශන ක්ෂේත්‍රයේ ගුණාත්මක උන්නතිය උදෙසා පසුගිය කාලය පුරා සක්‍රිය දායකත්වයක් සැපයූ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මෙම කරුණ කෙරෙහි සිය අවධානය යොමු කර ග්‍රන්ථ ප්‍රකාශනයට මාර්ග දර්ශකයක් ලෙස මෙම කෘතිය එළි දක්වා ඇත.

ලේඛකයන්, ප්‍රකාශකයන්, මුද්‍රණකරුවන් සහ ප්‍රකාශන ක්ෂේත්‍රයට සම්බන්ධ ආධුනිකයන් හට මෙම කෘතිය ඉතා ප්‍රයෝජනවත් වූ හෙයින් තෙවැනි මුද්‍රණයක් ලෙස එළි දැක්වීමට කටයුතු කරනු ලබන්නේ ඉමහත් සතුටිනි. මෙම කෘතිය නැවත ප්‍රකාශයට පත් කිරීමේ දී අවශ්‍ය මඟපෙන්වීම හා උපදෙස් ලබා දුන් මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) එන්. එච්. එම්. චිත්‍රානන්ද මහතාට, අධ්‍යක්ෂක නාලිනී මල්ලවආරච්චි මහත්මියට, නියෝජ්‍ය අධ්‍යක්ෂ සේනානි බණ්ඩාර

මහත්මියට, ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශයේ අංශ ප්‍රධාන ශ්‍රීමා සූරියබණ්ඩාර මහත්මියට, ජී. එච්. මංගල මහතාට සහ සහාය දුන් සැමට මාගේ ස්තුතිය පුද කර සිටිමි.

**මහාචාර්ය සෝමරත්න බාලසූරිය**
සභාපති,
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන,
සේවා මණ්ඩලය,
අංක 14, කොළඹ 07,
2012 නොවැම්බර්.

# පටුන


සිවු වැනි මුද්‍රණයේ පෙරවදන v-vi
තෙවැනි මුද්‍රණයේ පෙරවදන vii-viii
පටුන viii-ix

1. මුල් පිටු 1-32

1.1 අර්ධ ග්‍රන්ථනාම පිටුව 1
1.2 අර්ධ ග්‍රන්ථනාම පිටුවේ පසු පිටුව 2
1.3 ග්‍රන්ථනාම පිටුව 4
1.3.1 ග්‍රන්ථනාමය 6
1.3.1.1 සමාන්තර ග්‍රන්ථනාමය 7
1.3.1.2 පරිවර්තන/ අනුවර්තන ග්‍රන්ථයක ග්‍රන්ථනාමය දැක්වීම 8
1.3.1.3 උපග්‍රන්ථනාමය 8
1.3.2 කර්තෘ 9
1.3.3 ප්‍රකාශක 12
1.4 ග්‍රන්ථනාම පිටුවේ පසු පිටුව 13
1.4.1. ග්‍රන්ථ නාමය 13
1.4.2 අවසරයකින් තොර ව ග්‍රන්ථයේ උපුටා ගැනීම් පිළිබඳ ප්‍රකාශය 14
1.4.3 කර්තෘ හිමිකම් ප්‍රකාශය 14
1.4.4 පුනර්-මුද්‍රණය (ඇති විට) 15
1.4.5 සංස්කරණය පිළිබඳ දැක්වීම (සංස්කාරකවරයෙක් සිටී නම්) 15
1.4.6 අන්තර්ජාතික ප්‍රමිති අංක 16
1.4.6.1 අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය 16
1.4.6.2 අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංකය 17
1.4.7 ප්‍රකාශනගත සූචිකරණ දත්ත 17
1.4.8 ග්‍රන්ථය සඳහා දායකවූවෝ 18
1.4.9 ප්‍රකාශක 19
1.4.10 බෙදාහැරීම 19
1.4.11 ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් 19

1.4.12 විශේෂ අවස්ථා 22
1.4.12.1 පුස්තකාල නිර්දේශය 22
1.4.12.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල බලපත්‍රය 23
1.4.12.3 අනුග්‍රහය පිළිබඳ ප්‍රකාශය (තිබේ නම්) 23
1.4.12.4 ශුද්ධි පත්‍රයක් ඇතුළත් කරන අවස්ථා 25
1.5 පිළිගැන්වීමේ පිටුව 26
1.6 ස්තුතිය / උපකාරානුස්මෘතිය 27
1.7 පෙරවදන 27
1.8 හැඳින්වීම/සංඥාපනය 28
1.9 පටුන 29
1.10 කෙටි යෙදුම්/ හැකිළුම් පද/ සංකේත 32

**2. අන්තර්ගතය 33-45**

2.0. පොතක් යනු 33
2.1 පොතක පෙළ කොටසෙහි (අන්තර්ගතයේ) ආරම්භය 33
2.2 පිටු අංකනය කිරීම 34
2.3 දිවෙන ග්‍රන්ථ නාමය 36
2.4 ග්‍රන්ථයෙහි ප්‍රමාණය 37
2.5 කඩදාසි වර්ග 39
2.6 පිටුවෙහි සැකැස්ම 41
2.7 අකුරු ප්‍රමාණය 43
2.7.1. අකුරු හැඩය 45

**3. පසු පිටු 46-50**

3.1 ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 46
3.1.1 ඒපීඒ ක්‍රමය 47
3.1.2 චිකාගෝ ක්‍රමය 47
3.1.3 හාවර්ඩ් ක්‍රමය 48
3.2 පාරිභාෂික පද මාලාව 48
3.3 සූචිය/ අනුක්‍රමණිකාව 48
3.4 උපග්‍රන්ථ 50

**4. නිමාව 51-57**

4.1 පිට කවරය සකස් කිරීම 51
4.2 පසු පිට කවරය 52
4.2.1 පසුවදන 52
4.2.2 අන්තර්ජාතික ප්‍රමිති අංක සහ බාර්කෝඩ් යෙදීම 54
4.2.3. ග්‍රන්ථයෙහි වෙළෙඳ මිල 54
4.2.4 ප්‍රකාශකගේ නම සහ ලිපිනය (අවශ්‍ය නම්) 54
4.2.5 ග්‍රන්ථයේ නාරටිය 54
4.3 දූවිලි කවරය 55
4.4 බැම්ම 57

# රූප සටහන් පටුන


| රූප අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 1, 2 | අර්ධ ග්‍රන්ථනාම පිටුවේ ග්‍රන්ථනාමය නිවැරදි ව දක්වන අයුරු | 2 |
| 3, 4 | කර්තෘගේ වෙනත් කෘති නිවැරදිව දක්වන අයුරු | 4 |
| 5 | ග්‍රන්ථනාම පිටුවක නිවැරදි සැකැස්ම | 5 |
| 6 | ග්‍රන්ථනාම පිටුවේ ග්‍රන්ථනාමය නිවැරදි ව දක්වන අයුරු | 6 |
| 7 | ග්‍රන්ථනාම පිටුවේ ග්‍රන්ථනාමය නිවැරදිව දැක්වීම (නොකළ යුතු ක්‍රමය) | 6 |
| 8 | ග්‍රන්ථනාම පිටුවේ සමාන්තර ග්‍රන්ථනාමය සඳහන්ව ඇති අයුරු | 7 |
| 9 | පිට කවරයේ සමාන්තර ග්‍රන්ථනාමය සඳහන්ව ඇති අයුරු | 7 |
| 10, 11 | පරිවර්තන/ අනුවර්තන ග්‍රන්ථයක ග්‍රන්ථනාමය නිවැරදි ව දක්වන අයුරු | 8 |
| 12 | ග්‍රන්ථනාමය සහ උප-ග්‍රන්ථනාමය නිවැරදි ව දක්වන අයුරු | 9 |
| 13 | තනි පුද්ගල කර්තෘවරයකුගේ ග්‍රන්ථයක් | 10 |
| 14 | සම කර්තෘ/ බහු කර්තෘ දක්නට ලැබෙන ග්‍රන්ථයක් | 10 |
| 15 | සංස්කාරකවරයකු සහිත ග්‍රන්ථයක් | 11 |
| 16 | කර්තෘවරයා ලෙස සම්පාදකයකු සිටින ග්‍රන්ථයක් | 11 |
| 17 | පරිවර්තනය කරන ලද ග්‍රන්ථයක් | 11 |
| 18 | අනුවර්තනය කරන ලද ග්‍රන්ථයක් | 11 |
| 19 | කර්තෘ ප්‍රකාශනයක් | 12 |
| 20 | සම ප්‍රකාශනයක් (ආයතනික) | 12 |
| 21 | ආයතනයක් ප්‍රකාශකයකු වන අවස්ථාවක් | 13 |
| 22 | කර්තෘ සහ ප්‍රකාශක එකම ආයතනය වන අවස්ථාවල | 13 |

| | | |
|---|---|---|
| 23 | ජා.පු.සේ.මා. විසින් ලබා දෙන ප්‍රකාශනගත සූචිකරණ දත්ත සටහනක් | 18 |
| 24 | ආදර්ශ පිටුවක් (ග්‍රන්ථනාම පිටුවේ පසුපිටුව) | 20 |
| 25 | ජා.පු.ප්‍ර.සේ.ම ලබා දෙන පුස්තකාල සඳහා නිර්දේශය | 22 |
| 26 | පුස්තකාල සඳහා නිර්දේශය ග්‍රන්ථනාම පිටුවේ දක්වන අයුරු | 22 |
| 27 | අධ්‍යාපන අමාත්‍යාංශයේ බලපත්‍රය | 23 |
| 28 | අනුග්‍රාහක ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථනාම පිටුවක ආකෘතිය | 24 |
| 29 | ශුද්ධි පත්‍රය සහිත පිටුවක ආකෘතිය | 25 |
| 30, 31 | පිළිගැන්වීමේ පිටුව | 26 |
| 32, 33 | ස්තුතිය / උපකාරානුස්මෘතිය | 27 |
| 34 | පෙරවදන | 28 |
| 35 | හැඳින්වීම/සංඥාපනය | 29 |
| 36 | පටුනක් සකස් කිරීමේ දළ ආකෘතිය | 30 |
| 37 | ග්‍රන්ථයක මුල්පිටු පටුනක දැක්වීම | 31 |
| 38 | ග්‍රන්ථයක පරිච්ඡේද පටුනක දැක්වීම | 31 |
| 39 | සිතියම්, ඡායාරූප, රූපසටහන් ආදිය පටුනක් තුළ දැක්වීම | 31 |
| 40 | ග්‍රන්ථයක පළමු පරිච්ඡේදය ආරම්භ වන ආකාරය | 33 |
| 41 | සෑම පරිච්ඡේදයක ම ආරම්භක පිටුවේ පිටු අංකය මුද්‍රණය නොකිරීම | 35 |
| 42 | පෙරවදනේ සිට පළමු පරිච්ඡේදය දක්වා පිටු සඳහා රෝම ඉලක්කම් යොදා ගැනීම | 35 |
| 43 | පිටු අංක ග්‍රන්ථයේ පහළ කෙළවරේ ස්ථානගත කිරීම | 35 |
| 44 | පිටු අංක ග්‍රන්ථයේ ඉහළ කෙළවරේ ස්ථානගත කිරීම | 35 |

| | | |
|---|---|---|
| 45 | පරිච්ඡේද නාම රහිත ග්‍රන්ථයක දිවෙන ග්‍රන්ථනාමය දක්වන අයුරු | 36 |
| 46 | පරිච්ඡේද නාම සහිත ග්‍රන්ථයක දිවෙන ග්‍රන්ථනාමය දක්වන අයුරු | 37 |
| 47 | A ශ්‍රේණියේ කඩදාසි වර්ග බෙදීම | 38 |
| 48 | ග්‍රන්ථ මුද්‍රණය සඳහා යොදා ගන්න මූලික කඩදාසි වර්ග | 40 |
| 49 | 2.1 සිට 2.5 දක්වා සඳහන් කරුණු අනුව සකස් කරන ලද නිවැරදි පිටුවක ආකෘතිය | 42 |
| 50 | ග්‍රන්ථයක අන්තර්ගතය සහ පාද සටහන් නිසි පරිදි දක්වා ඇති පිටුවක් | 44 |
| 51 | කාව්‍ය ග්‍රන්ථ තුළ නිර්මාණාත්මකව විවිධ අකුරු රටා භාවිත කර ඇති ආකාරය | 45 |
| 52 | සූචිය සහිත පිටුවක සැකැස්ම | 49 |
| 53 | උපග්‍රන්ථ දක්වා ඇති පිටුවක් | 50 |
| 54 | ග්‍රන්ථනාමය සහ කර්තෘ නාමය සඳහන් පිටකවරයක් | 52 |
| 55 | පරිවර්තනය කරන ලද කෘතියක පිට කවරයේ, මුල් කර්තෘගේ නමට ප්‍රමුඛස්ථානය ලබා දීම | 52 |
| 56 | පසුවදන ලෙස කෘතියේ අන්තර්ගතයේ කොටසක් දැක්වීම | 53 |
| 57 | පසුවදන ලෙස කතුවරයා පිළිබඳ හැඳින්වීමක් දැක්වීම | 53 |
| 58 | පසුවදන ලෙස විෂය ප්‍රවීණයකුගේ අදහස් දැක්වීමක් | 53 |
| 59 | පසුවදන ලෙස කෘතියේ සාරාංශයක් දැක්වීම | 53 |
| 60 | අන්තර්ජාතික ප්‍රමිති අංක බාර්කෝඩ් එකක් ලෙස සකස් කර ඇති අයුරු | 54 |
| 61 | ග්‍රන්ථයක පසුපස පිටකවරයේ ප්‍රකාශකගේ තොරතුරු දක්වන ආකාරය | 54 |

| | | |
|---|---|---|
| 62 | ග්‍රන්ථයක පසුපස පිටකවර නිර්මාණය විය යුතු ආකාරය | 55 |
| 63 | නිවැරදිව දූවිලි කවරයක් සකසා ගන්නා ආකෘතිය | 56 |


## වගු සටහන් පටුන


| වගු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 1 | ග්‍රන්ථ මුද්‍රණය සඳහා ශ්‍රී ලංකාව තුළ යොදාගන්නා සම්මත ප්‍රමාණ | 38 |
| 2 | ග්‍රන්ථ පිටු සැලසුම්කරණය සඳහා ශ්‍රී ලංකාව තුළ යොදාගන්නා සම්මත ආන්තික ප්‍රමාණ | 41 |

# සම්පාදක මණ්ඩලය (නව සංස්කරණය)

**ජයදේව උයන්ගොඩ**
සේවාර්ජිත මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය.

**ඩබ්ලිව්. සුනිල්**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

**සේනානි බණ්ඩාර**
අධ්‍යක්ෂ, පුස්තකාල ප්‍රවර්ධන, ප්‍රමිතිකරණ හා ප්‍රකාශන,
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

**උදිත අලහකෝන්**
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා
තොරතුරු විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය.

**චන්දිමා වාදසිංහ**
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති,
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය.

**පී. හිරිමුතුගොඩ**
බාහිර කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
මුද්‍රණ උපදේශක කමිටු සාමාජික (ජා.පු.ප්‍ර.සේ.ම)

**මෛත්‍රී ජයසුන්දර**
නි. අධ්‍යක්ෂ, ග්‍රන්ථ විඥාපන හා පාලන,
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

**මලික් චමින්ද ධර්මවර්ධන**
සහකාර අධ්‍යක්ෂ, ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය,
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

**දිනුක මලින්ද හේරත්**
ප්‍රකාශන නිලධාරී,
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

පළමු වැනි පරිච්ඡේදය

# ග්‍රන්ථයක භෞතික නිමාව

ග්‍රන්ථයක් ප්‍රකාශනයට පත් කිරීමේ දී එහි අන්තර්ගතයේ වැදගත්කම මෙන් ම නිවැරදි ප්‍රමිතිවලට අනුකූලව ග්‍රන්ථය මුද්‍රණය කිරීම ද වැදගත් වේ. නිවැරදි ප්‍රමිතිවලට අනුව මුද්‍රණය වූ ග්‍රන්ථයක් පරිශීලනය කිරීම පාඨකයාට වඩා ආකර්ෂණීය වන අතර අන්තර්ගතයේ ඇති තොරතුරු අපහසුතාවකින් තොර ව උකහා ගැනීමට ද හැකි වේ. එය ග්‍රන්ථයක වෙළෙඳපොළ ඉල්ලුම සඳහා ද ඉවහල් වේ.

## 01 මුල් පිටු

ග්‍රන්ථයක මුල් පිටු යනුවෙන් අදහස් කෙරෙන්නේ පිළිවෙළින් අර්ධ ග්‍රන්ථනාම පිටුව, අර්ධ ග්‍රන්ථනාම පිටුවෙහි පසු පිටුව, ග්‍රන්ථනාම පිටුව, ග්‍රන්ථනාම පිටුවෙහි පසු පිටුව, පිළිගැන්වීම, ස්තූතිය, පෙරවදන, හැඳින්වීම, කෙටි යෙදුම් සහ පටුන ය.

### 1.1 අර්ධ ග්‍රන්ථනාම පිටුව (Half Title page)

පිට කවරයෙන් පසු ව යෙදෙන පළමු පිටුව අර්ධ ග්‍රන්ථනාම පිටුව වේ. මෙහි ග්‍රන්ථනාමය පමණක් සඳහන් කළ යුතු ය. උප-ග්‍රන්ථනාමය/ සමාන්තර ග්‍රන්ථනාමය/ විකල්ප ග්‍රන්ථනාමය ඇත්නම් එය ද සඳහන් කළ හැකි ය. (රූපය 1 සහ 2 බලන්න)

**මුද්‍රණ උපදෙස් -**

**ආදර්ශයේ දක්වා ඇති පරිදි මේ පිටුවෙහි මැදින් (තරමක් ඉහළට වන සේ) ග්‍රන්ථ නාමය සඳහන් කරන්න. එසේ නොමැති නම් පිටු සැලසුම්කරුගේ උපදෙස් පරිදි එය**